# වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

## සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

# සංස්ථාපිත සමාගම් වෙත නිකුත් කරන

# වැදගත් නිවේදනයයි

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති ඇතැම් සමාගම්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ අනිවාර්ය අවශ්‍යතාවක් වන වාර්ෂික වාර්තා (Annual Returns) ඉදිරිපත් නොකරන බව නිරීක්ෂණය වී ඇත.

සමාගම් පනතේ 133(1) වගන්තියට අනුව, සියලුම සංස්ථාපිත සමාගම් ඔවුන්ගේ වාර්ෂික මහා සභා රැස්වීම් (AGM) පැවැත්විය යුතු අතර, එම රැස්වීමේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත, අදාළ ගාස්තු ගෙවීමෙන් පසු වාර්ෂික වාර්තා (ආකෘති පත්‍ර අංක 15/15A) සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය. වාර්ෂික මහා සභා රැස්වීමක් නොපැවැත්වූ අවස්ථාවකදී, සමාගමක් විසින් සමාගම් පනතේ 144(3) වගන්තිය යටතේ යෝජනාවක් සම්මත කළ යුතුය.

වාර්ෂික වාර්තා ඉදිරිපත් නොකරන සමාගම් සඳහා රු. 1,000,000/- නොඉක්මවන දඩයකට/දඬුවමකට යටත් වන අතර, පනතේ 133(5) වගන්තිය ප්‍රකාරව එවැනි පැහැර හරින ලද සමාගම්වල සියලුම අධ්‍යක්ෂවරුන් රු. 50,000/- නොඉක්මවන දඩයකට/දඬුවමකට යටත් වනු ඇත.

එබැවින්, සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති සමාගම්වල අධ්‍යක්ෂවරුන්, ලේකම්වරුන් සහ අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශවයන්/කොටස්කරුවන් වෙත මෙයින් දැඩි ලෙස අවධාරණය කරනු ලබන්නේ, එවැනි සමාගම්වල හිඟව පවතින සියලුම වාර්ෂික වාර්තා අදාළ ගාස්තු ගෙවීම් සමඟ 2026 සැප්තැම්බර් 30 වන දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතු බවයි. මෙම අවශ්‍යතාවය ඉටු කිරීමට අපොහොසත් වීමෙන් සමාගම ලේඛනයෙන් ඉවත් කිරීමට (strike off) හේතු විය හැක.

ඒ අනුව 2026.03.30 දිනැති පුවත්පත් නිවේදනයට අනුව කටයුතු කිරීම සඳහා ඔබ වෙත ලබාදී ඇති කාල සීමාව තවත් මාස 04කින් අවසන් වන බව මෙයින් දන්වමි.

**සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,**
**සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,**
**අංක 400, ඩී.ආර්. විජේවර්ධන මාවත,**
**කොළඹ 10.**